PDF Compressor Pro



**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සංවර්ධන නිලධාරි (නීති)</u>**
**<u>තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>**

1. සම්බන්ධ වන ආයතන

| | | |
|---|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව: | යොමු අංකය: - | දිනය: |
| 1.2. අමාත්‍යාංශය: | යොමු අංකය: - | දිනය: |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම: | යොමු අංකය:-DMS/D/පොදු/11-2 | දිනය: 2012.12.19 |
| 1.4. ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය : | යොමු අංකය:- CSO/PTR/3/2/2 | දිනය: 2014.04-02 |
| 1.5. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : | යොමු අංකය: | දිනය: |
| 1.6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය: | යොමු අංකය: 1/4/2/5/101 | දිනය: 2014.06.25 |
| 1.7. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:- | යොමු අංකය: | දිනය: |

2. පත් කිරීමේ බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3. සේවා ගණය පිළිබඳ විස්තර :-

3.1. සේවා ගණය :- ආශ්‍රිත නිලධාරි

3.2. ශ්‍රේණිය :- III , II සහ I ශ්‍රේණි

3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය:

ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හිදී විධායක මට්ටම්වල කාර්ය භාරයට උපස්ථම්භක වන්නාවූ නීතිමය කටයුතුවලට අදාළ තොරතුරු හා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය, සම්පාදනය, පවත්වාගෙන යාම වැනි නීති විෂයට අදාළ කාර්යයන් අතුරින් නිශ්චිත කාර්යය භාරයක් වූද, බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නාවූද කාර්ය භාරයක් පැවරෙන සේවා ගණයකි.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

4. තනතුරේ ස්වභාවය :- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප්:

5.1. වැටුප් කේත අංකය :- MN 4-2006 A

5.2. වැටුප් පරිමාණය :- රු.15,215/- 10X215 - 4X 240 - 7X 320 -15X 360 - 25,965/-

අනුමත කරන ලදී.
දිනය 2014/07/07

PDF Compressor Pro

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය(රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.15,215/- |
| II | පියවර 12 | රු.17,605/- |
| I | පියවර 23 | රු.20,925/- |

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1. අනුමත තනතුරු නාම,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සංවර්ධන නිලධාරි (නීති) | III<br>II<br>I | 07 | • අධිකරණයේ විභාග වන සියලුම නඩුවලට අදාළ ගොනු පවත්වාගෙන යාම.<br>• නීතිපති දෙපාර්තමේන්තුවට අදාළ වන සියළුම ලිපිලේඛන හා වාර්තා පවත්වාගෙන යාම.<br>• මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යැවිය යුතු වාර්තා පිළිබඳ ගොනු පවත්වාගෙන යාම.<br>• පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යැවිය යුතු වාර්තා පිළිබඳ ගොනු පවත්වාගෙන යාම.<br>• නීතිමය කටයුතුවලට අදාළ තොරතුරු හා දත්ත පවත්වාගෙන යාම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- (07 ) ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්යය සඳහා III,II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :-

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම:

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද :- අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :- සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත යුක්ත විය යුතුය.

2016.07.27 ... 1/1/4/261

PDF Compressor Pro

7.2.2.5 වෙනත් සුදුසුකම් :- (අ) ශ්‍රී ලාංකිකයෙකු වීම.
(ආ) යහපත් චරිතයකින් යුක්ත අයවළුන් වීම.
(ඇ) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ වසර 03 ක ස්ථිර පදිංචියක් සහිත අයවළුන්වීම.

7.2.2 වයස :

7.2.2.1 අවම සීමාව :- අවුරුදු 21 යි.

7.2.2.2 උපරිම සීමාව :- අවුරුදු 35 යි.

7.2.3 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අවබෝධය<br>සාමාන්‍ය දැනීම<br>අභියෝග්‍යතාව | 100<br>100<br>100 | 40% |

(ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය උපලේඛනය 1හි දැක්වේ)
ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2.4.1.1 පවත්වන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- (ලකුණු ලබා දෙනු නොලැබේ.)

7.2.4.3.1 ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :-
අයදුම්කරුවන් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් පරීක්ෂාකර බැලීම සඳහා පමණක් මෙය පවත්වනු ලැබේ.

7.2.4.3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ :- අදාළ නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :-
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින්

7.3 සීමිත බඳවා ගැනීම :- අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නොවේ.

1/1/4/261 2014/07/07

PDF Compressor Pro

08. කාර්යක්ෂමතා කඩඉම :-

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යනවග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උප ලේඛනය2) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර තුන(03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උප ලේඛනය 3) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර පහ(05) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උප ලේඛනය 4) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :-

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වසරකට එක් වරක් හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා :-

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන බලධරයකු විසින් පවත්වනු ලැබේ.

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 විධිවිධාන අනුව අදාළ වන මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

10. ශ්‍රේණි උසස් කිරීම:

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම :-

10.1.1. සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම :-

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.



4/4/261 2014.07.07

PDF Compressor Pro

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව, උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීමට නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීමේ බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වසර 10 සම්පූර්ණ කළ දිනය හා සුදුසුකම් සම්පූර්ණ කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම :-

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. නිලධර ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක(10) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම කාලය තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක්(10) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස්වීමේ දිනට පූර්වාසන්න වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘතිපත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවා ගණයේ වසර දහය(10) සම්පූර්ණ කරන නිලධරයන්ගෙන් සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරු වලට පත් කිරීම :- අදාළ නොවේ.

1/1/4/261 ... 2014.03.07

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝග වලට ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු වේ.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන:

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. මෙම පරිපාටියේ විධිවිධාන සළසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කලේ : අත්සන : ..........................

පරීක්ෂා කලේ : ..........................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

එස්. එම්. එච්. කුඩම්පිටි
පරිපාලන නිලධාරි (විෂය භාර)
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත් සභාව

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : 2014.04.07

අත්සන: ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම :

තනතුර :

නිල මුද්‍රාව : එම්. ඒ. ඩී. චන්ද්‍රිකා රූපසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
(පිරිස් හා පුහුණු)
බස්නාහිර පළාත් සභාව.

යොමු අංකය : CS0/PTR/3/2/2

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි(නීති) සඳහා වන මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන: ..........................

නම : ..........................

ප්‍රධාන ලේකම්

බස්නාහිර පළාත

දිනය : 2014-04-07

නිල මුද්‍රාව : ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

PDF Compressor Pro

යොමු අංකය: 1/4/2/5/101

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි(නිනි) සඳහා වන මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය 2014.06.24 දින බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

අත්සන:..........

නම :..........

ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

දිනය 2014.06.25

නිල මුද්‍රාව: ..........

යොමු අංකය 1/1/4/261

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි(නිනි) තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය 2014.07.07 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අත්සන:..........

නම :..........

ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දිනය: 2014/7/7

නිල මුද්‍රාව: ..........
සුනිල් අබේවර්ධන,
බ.ප. ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

1/1/4/261 2014.07.07

උපලේඛන - 01

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සංවර්ධන නිලධාරි (නීති) බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය

11 විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී (නීති)තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අවබෝධය | පැය 1 ½ | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 1 | 100 | 40% |
| 3. අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: සේවයේ අවශ්‍යතාවය මත හෝ පූරප්පාඩු ඇතිවන ආකාරයට

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| අනු අංකය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 1. | අවබෝධය | අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, සාරාංශකරණය, අක්ෂර වින්‍යාසය, සරල වාක්‍ය,ව්‍යාකරණ භාවිතය පිළිබඳව දැනුම පරික්ෂා කෙරේ. |
| 2. | සාමාන්‍ය දැනීම | දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන කාලීන සිද්ධීන් පිළිබඳ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |
| 3. | අභියෝග්‍යතාව | අපේක්ෂකයාගේ තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණය හා සංස්ලේෂණ හැකියාව මැනෙන පරිදි සකස් වන ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන: ..........................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම: ..........................................................

තනතුර : ..........................................................

දිනය : [illegible]

එච්. ඒ. ඩී. චන්ද්‍රිකා රූපසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
(රිය හා මුදල්)
බස්නාහිර පළාත් සභාව.

PDF Compressor Pro



# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සංවර්ධන නිලධාරි (නීති) III ශ්‍රේණියේ තනතුරට අදාළ I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි(නීති) III ශ්‍රේණියේ තනතුර සඳහා I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් මුල්‍ය රීති | පැය 02 | 100 | 40% |
| නීතිය | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධාරියා : පත්වීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි පවත්වනු ලබේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් මූල්‍ය රීති සංග්‍රහය | ආයතන සංග්‍රහයේ V1, V11, V111, X11, X1V, XV11, XX1V, XXV, XXV1, XXV11, XXV111, XXX, XXX111, XLV11, XLV111 පරිච්ඡේද සහ බස්නාහිර පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 1,11,111, 1V, V පරිච්ඡේද |
| නීතිය | ඇ. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.<br>ආ. ශ්‍රී ලංකාවේ නීති ක්‍රම සහ උසාවි සංවිධාන.<br>ඇ.<br>I. පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් පිළියෙල කිරීම හා එහිදී ගැබ්විය යුතු මූලික කරුණු පිළිබඳ කටයුතු කිරීම.<br>II. පළාත්සභාවට අදාළ නඩු සඳහා නිරීක්ෂණ ඉදිරිපත්කිරීම.<br>III. පළාත් අමාත්‍යාංශ හා නීතිපතිවරයා අතර නෛතික කටයුතු සම්බන්ධ ක්‍රියා මාර්ග.<br>IV. පළාත් සභා පනත පිළිබඳව හා ඒ ආශ්‍රයෙන් පැන නගින ගැටළු සම්බන්ධව කටයුතු කිරීම.<br>V. මූලික අයිතිවාසිකම් හා එම මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට බලපාන කරුණු. |

අත්සන: ..................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..................................................
තනතුර : ..................................................
දිනය : ..................................................
නිල මුද්‍රාව :

දිනය : 2016.07.07

එම්. ඒ. ඩී. චන්ද්‍රිකා රූපසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
(පිරිස් හා පුහුණු)
බස්නාහිර පළාත් සභාව.

PDF Compressor Pro



බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සංවර්ධන නිලධාරි(නීති) II ශ්‍රේණියේ තනතුරට අදාළ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි (නීති) II ශ්‍රේණියට අදාළ 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය/විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය සාමාන්‍ය අවබෝධය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් සහිතව) | පැය 02 | 100 | 40% |
| සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධතිය | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධාරියා : මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්කිරීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද : වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය සාමාන්‍ය අවබෝධය | ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී බලපාන කරුණු, ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මූලධර්මයන්, ශ්‍රී ලංකාවේ මෑත ආර්ථික හා සමාජමය හා දේශපාලන ඉතිහාසය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ අවබෝධය |
| සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධතිය | ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රය, ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාත්මක පසුබිම, පළාත්සභා ක්‍රමය, පළාත් පාලනය, මහජන සංවිධාන, රාජ්‍ය සංවිධාන යනාදී කරුණු සම්බන්ධයෙන් අවබෝධය. |

අත්සන: ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම: ..........................................

තනතුර : ..........................................

දිනය : ..........................................

එච්. ඒ. ඩී. චන්ද්‍රිකා රූපසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
(පිරිස් හා පුහුණු)
බස්නාහිර පළාත් සභාව.

PDF Compressor Pro



බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සංවර්ධන නිලධාරි(නීති) 1 ශ්‍රේණියේ තනතුරට අදාළ 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි(නීති) 1ශ්‍රේණියට අදාළ 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 02 | 100 | 40% |
| නීතිය 11 | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධාරියා : මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්කිරීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද : වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | 1. කළමනාකරණ ශ්‍රිතයන්<br>2. කළමනාකරණ මූලධර්ම<br>3. කාර්යාල කළමනාකරණය |
| නීතිය II | ඓතිහාසික සංවර්ධනයද ඇතුළුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා සංශෝධනයන්, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය, පළාත් පාලන ආඥා පනත්. |

අත්සන: ......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම: ......................................

තනතුර : ......................................

දිනය : ......................................

ඩබ්. ඒ. ඩී. චමිලා රූපසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
(පිරිස් හා පුහුණු)
බස්නාහිර පළාත් සභාව.